# වහරල ලිපි මඟින් හෙළිවන ක්‍රි.ව. 5, 6 සහ 7 වන සියවස්වල අක්ෂර භාවිතය පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

**R.M.W.G. Pradeepa Rajanayaka**

**South Eastern University of Sri Lanka**

**Asst. Lecturer at Department of Languages**

**Pradeeparajanayaka90@gmail.com**

## පර්යේෂණ සංක්ෂිප්තය

මෙරටින් මෙතෙක් හමුව ඇති සෙල්ලිපි අතර නූතනය වන විට දැඩි කතාබහකට ලක් වූ සෙල්ලිපි විශේෂයක් වශයෙන් වහරල ලිපි හඳුනාගත හැකි ය. මේවා හුදෙක් සෙල්ලිපි විශේෂයක් නොවන අතර එහි අන්තර්ගත වහරල යන වචනය මත ගොඩ නගා ගත් අදහසක් බව කිව හැකි ය. මෙම වහරල යන වචනය අන්තර්ගතව විශාල ලිපි ප්‍රමාණයක් හමුවීමත් එම ලිපි වලින් කියැවෙන තොරතුරු පිළිබඳ විවිධ පුරාවිද්වතුන් විසින් එකිනෙකට වෙනස් ලෙස අර්ථකතනය කිරීමත් සමඟ නිරායාසයෙන්ම මේවා වහරල ලිපි යනුවෙන් හැඳින්වීමට පටන් ගෙන ඇත. බෙහෝමයක් වහරල ලිපි ක්‍රි.ව. 6 වන හා ක්‍රි.ව. 7 වන කාල සීමාවට අයත් වන බවත් ඇතැම් ලිපි ක්‍රි.ව. 5 වන සියවසෙහි ද රචනා වී ඇති හෙයින් මෙම ලිපි ක්‍රි.ව. 5, 6 හා 7 යන කාල සීමාවෙහි ලියවෙන්නට ඇතැයි අනුමාන කරති. කෙසේ නමුත් වහරල ලිපි හරහා අනාවරණය වන තත්කාලීන සමාජය, සමාජ පුරාවිද්‍යාත්මක මෙන්ම අභිලේඛන විද්‍යාත්මක තොරතුරු පිළිබඳ තොරතුරු රාශියක් අනාවරණය වන අතර ඒ සඳහා යොදා ගත් අක්ෂර භාවිතය පිළිබඳ මෙහි දී වාග්විද්‍යාත්මකව අධ්‍යයනයට ලක් කෙරේ. මෙහි දී දත්ත හඳුනා ගැනීම ප්‍රාථමික මූලාශ්‍ර ලෙස ගෙන ඒ හරහා ශ්‍රි ලංකාවේ අනුරාධපුර වෙස්සගිරි පුරාවිද්‍යාත්මක භූමියේ හා අනුරාධපුර කුඩා රත්මලේ දක්නට ලැබෙන වහරල ලිපි මෙම පර්යේෂණය සඳහා විශේෂයෙන් යොදා ගත් අතර ඊට අමතරව නිලගම ලිපිය, නාගිරිකන්ද ලිපිය, කුඩාරත්මලේ ලිපිය, මැදගම විහාර ලිපිය,  උට්ටිමඩුව ලිපිය,  රිදී විහාර සැරසුම්ගල ලිපිය, සංගමුග විහාර ලිපිය, කන්දකාඩු ලිපිය ආදී ලිපි අධ්‍යයනය කොට ඇත. ද්විතීක මූලාශ්‍ර ලෙස එම ලිපිවල අඩංගු දත්ත එකතු කර ගැනීමට ක්ෂේත්‍ර ගවේශණය කළ අතර එමෙන්ම සම්මුඛ සාකච්ඡා, ඡායාරූප, දත්ත විශ්ලේෂණය කිරීම හා දත්ත ඉදිරිපත් කිරීම සිදු විය. මේ හරහා ශ්‍රී ලංකාවේ "වහරල ලිපි" වල අක්ෂර භාවිතය වර්තමානයේ පවතින වාග්විද්‍යාත්මක න්‍යායන් ඔස්සේ අර්ථනිරූපනය කළ හැකි විය. ඒ අනුව වහරල ලිපි යනු ක්‍රි.ව. 5, 6 හා 7 යන සියවස් වල සිංහල භාෂාවෙහි එනම් වර්තමාන සිංහලයට ආවේණික වූ බොහෝ ලක්ෂණ වහරල ලිපි අයත් කාල වකවානුව තුළ දක්නට ඇති නිසා සිංහල භාෂා ඉතිහාසය සමබන්ධ වැදගත් යුගයක් ලෙස මෙය නම් කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** වහරල ලිපි, සමාජ පුරාවිද්‍යාත්මක, අභිලේඛන විද්‍යාත්මක, වාග්විද්‍යාත්මක, වෙස්සගිරි, කුඩා රත්මලේ.

## හැඳින්වීම

වහරල යන වචනය ක්‍රි.ව. 5 වන හා 7 වන සියවස් අතර සෙල්ලිපි රාශියක හමුවන වචනයකි. වහරල යන මෙම වචනය විවිධ රූපාන්තරයන්ගෙන් සෙල්ලිපි වල දැක්වේ. වහරල ලිපි වල භාවිත අක්ෂර භාවිතය හඳුනා ගැනීම මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. ඒ අනුව වහරල ලිපි වලින් හෙළිවන 5 වන 6 වන හා 7 වන සියවස් වල අක්ෂර භාවිතය වත්මන් වාග්විද්‍යාත්මක න්‍යායන් ඔස්සේ අධ්‍යයනය කිරීම මෙහි දී සිදු වේ. මෙරට දැනට ප්‍රකාශයට පත් ව ඇති බ්‍රාහ්මී සෙල්ලිපි වල ආරම්භය පිළිබඳ විද්වතුන් අතර මතභේද පවතී. දිවයින පුරා ඇති සෙල්ලිපි පිහිටා ඇති ස්ථාන ලෙන් ලිපි, ගිරි ලිපි, ටැම් ලිපි, පුවරු ලිපි හා වෙනත් ලිපි ලෙස පවතී. තව ද මෙම සෙල්ලිපි වල අක්ෂර ලක්ෂණ, භාෂා පරිණාමය, රචනා ශෛලිය, ඓතිහාසික හා සමාජික වාර්ථා ආදිය පදනම් කරගෙන ද ඒවා අයත් වන යුග අනුව ද වර්ග කර ඇත.

## පර්යේෂණ ගැටලුව

විශේෂයෙන් අප මෙහි දී මූලික පර්යේෂණ ගැටලුව ලෙස හඳුනාගනු ලබන්නේ වහරල ලිපි වල අක්ෂර භාවිතය පිළිබඳ තොරතුරු විමසා බැලීම හා එතුළින් හෙළිවන ක්‍රි.ව. 5 වන 6 වන හා 7 වන සියවස් වල සිංහල භාෂාවෙහි අක්ෂර භාවිතය වර්තමානයේ පවතින වාග්විද්‍යාත්මක න්‍යායන් ඔස්සේ අර්ථනිරූපණය කළ හැකි ද යන්න සොයා බැලීම යි.

## පර්යේෂණයේ වැදගත්කම

මෙම පර්යේෂණයේ වැදගත්කම පිළිබඳ විමසා බැලීමේ දී ප්‍රධාන වශයෙන් ම කිව යුතු කරුණක් වන්නේ වහරල ලිපි යන වචනය සඳහා නිශ්චිත අර්ථකථනයක් තවමත් කිසිවකුත් ලබා දී නොමැති අතර තවමත් එය විවාදපන්නය. ඒ අනුව ඒ සඳහා නිශ්චිත අර්ථකථනයක් ලබා දිය හැකි දැයි විමසා බැලීම හා වහරල ලිපි මගින් එකළ භාවිත අක්ෂර වත්මන් වාග්විද්‍යාත්මක න්‍යායන් ඔස්සේ අධ්‍යයනය කරන හෙයින් මෙම අධ්‍යයනය ඉතාම වැදගත් වේ.

## පර්යේෂණයේ අරමුණ

ප්‍රධාන අරමුණක් ලෙස ක්‍රි.ව. 5 වන 6 වන හා 7 වන සියවස් වල අක්ෂර භාවිතය පිළිබඳ අධ්‍යයනය කර ඇති අතර උප අරමුණු ලෙස ශ්‍රී ලංකාවේ වාර්තා ගත වී ඇති වහරල ලිපි සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම මෙන්ම විද්වතුන් දක්වා ඇති අදහස් අධ්‍යයනය කිරීම සහ වහරල යන වචනය සඳහා අර්ථකථනයක් ලබා දීම මෙම පර්යේෂණයේ අරමුණු අතර වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙහි දී දත්ත හඳුනා ගැනීම ප්‍රාථමික මූලාශ්‍ර ලෙස ගෙන ඒ හරහා ශ්‍රී ලංකාවේ අනුරාධපුර වෙස්සගිරි පුරාවිද්‍යාත්මක භූමියේ හා අනුරාධපුර කුඩා රත්මලේ දක්නට ලැබෙන වහරල ලිපි මෙම පර්යේෂණය සඳහා විශේෂයෙන් යොදා ගත් අතර ඊට අමතරව තිලගම ලිපිය, නාගිරිකන්ද ලිපිය, කුඩාරත්මලේ ලිපිය, මැදගම විහාර ලිපිය, උට්ටිමඩුව ලිපිය, රිදී වහාර සැරසුම්ගල ලිපිය, සංගමුග විහාර ලිපිය, කන්දකාඩු ලිපිය ආදී ලිපි අධයයනය කොට ඇත. ද්විතීක මූලාශ්‍ර ලෙස එම ලිපිවල අඩංගු දත්ත එකතු කර ගැනීමට ක්ෂේත්‍ර ගවේශනය

කළ අතර එමෙන්ම සම්මුඛ සාකච්ඡා, ඡායාරූප, දත්ත විශ්ලේෂණය කිරීම හා දත්ත ඉදිරිපත් කිරීම සිදු විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ ශිලාලේඛන අධ්‍යයනයේ දී ක්‍රි.ව. 5 වැනි හා 7 වැනි සියවස් අතර සෙල්ලිපි රාශියක හමුවන වචනයකි වහරල. මෙම වචනය විවිධ රූපාන්තරයන්ගෙන් සෙල්ලිපි වල දැක්වේ. වෙහෙරිල, විහරිල, වහරලය, විහරලය, වෙහෙරලය ආදියෙන් පැමිණ එහි විවිධ රූපාන්තරයන්ට පසුව වහරල යන්න යෙදේ. විවිධ වියතුන් මෙම වහරල යන්නට දක්වන අදහස් විවිධාකාරය. මහාචාර්ය සෙනරත් පරණවිතාන වහල් යන අදහස දෙන බව දක්වයි. ඩි.ජේ විජේරත්නලී හෝ දැව කප්පවා පූජා කිරීම යන අදහස පල කරයි. මාලනී ඩයස් අනිවර්යය සේවයෙන් නිදහස් කිරීම බව පවසයි. විමලකිත්ති හිමි විහාර කුටි සෑදීම ලෙස දක්වයි. සද්ධාමංගල කරුණාරත්න විහාරවලට අදාල ගොඩනැගිලි සෑදීම ලෙස පවසයි. කොටනෙළුවේ චන්ද්‍රජෝති හිමි හා බන්දුසේන ගුණසේකර විහාර ගෙය සෑදීම හා විහාර කුටි සෑදීම ලෙස දක්වන අතර කරුණාසේන හෙට්ටිආරච්චි අනිවාර්ය සේවයෙන් නිදහස් වීම ලෙසත් බෙනිල් ප්‍රියංක විහාර කුටි විහාර ගොඩනැගිලි සෑදීම යනාදී අර්ථකතනයන් රාශියක් විවිධ විද්වතුන් වහරල ලිපි යන්නට ලබා දීම සිදු කර ඇත. ඒ අනුව මෙම වචනය සම්බන්ධයෙන් විද්වතුන් විවිධ අදහස් දක්වා ඇතත් ඔවුන් අතර ඒ සම්බන්ධ ඒකමතිකත්වයක් නොමැත.

වහරල යන වචනය කෙරෙහි වාග්විද්‍යාත්මකව අදහස් දක්වන පරණවිතාන කියා සිටිනුයේ එය සංස්කෘත වෘෂල යන්නෙන් සෑදුණු බවය. එය වෘෂල, වරෂල , වරසල , වරල ආදී වශයෙන් වූ බව ඔහුගේ අදහසයි. වහරල යන්න සංස්කෘත විසාර - ලී යන ශබ්දයෙන් සිද්ධ වූවක් යැයි ඩී.ජේ. විජේරත්න පවසයි. වහරල යන්න 'වහර' හා 'ල' යන වචන දෙක එක් වීමෙන් නිපන් සමාස පදයක් බව සිරිමල් රණවැල්ලගේ අදහසයි. එහි වහර යන්නෙන් විහාර යන අර්ථයත් ල යන්නෙන් ලහ හෙවත් සලාකය යන අර්ථයත් හැඟවෙන බව සඳහන් කරයි. බන්දුසේන ගුණසේකරගේ ද චන්දජෝති හිමියන්ගේ ද අදහස් වලට සමාන්තරව යමින් ආල ආලය යන වචන ගෘහ මන්දිර සඳහා වාචිකව යෙදෙන බවත් විහරි යනු වාසය කරන යන අර්ථය දෙන බවත් ඒ අනුව විහරි < අල < විහරිල යනුවෙන් විය හැකි බවත් පෙන්වා දී ඇත. විදවි යන්න විද් ධාතුවෙන් උපන් බවත් එහි අතීත ස්වරූපය මෙය බවත් මාලිනී ඩයස් ගේ අදහසයි. පූර්ව බ්‍රාහ්මීය යුගයේ ආඛ්‍යාත ක්‍රියා වෙනුවට යෙදුණේ කෘදන්ත රූපය ය. වහරල ලිපිවල එය වෙනස් වෙමින් ආඛ්‍යාත ක්‍රියා රූපය යෙදී ඇති අයුරු හඳුනාගත හැකි ය. විදවි යන්න ආඛ්‍යාත ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි. වෙයවය යන ආශිර්වාද ක්‍රියාව යෙදී ඇත. උත්තම පුරුෂයෙහි වෙමි යන අර්ථය දිම සඳහා පුද්ගල නාම සමග 'වි' ප්‍රත්‍යයක් යෙදී ඇත.

ඇත්ත වශයෙන්ම වහරල යනුවෙන් ලිපි විශේෂයක් නොමැති අතර එම වචනය නිසාම වහරල ලිපි යනුවෙන් හැඳින්වේ. මෙම සෙල්ලිපි පාඨවල අර්ථය ඉදිරිපත් කරන බොහෝ දෙනා තවමත් ලේඛන පිහිටුවා ඇති ස්ථානය ඒවායේ ආකෘතිය ආදිය පිළිබඳ දීර්ඝ වශයෙන් සැලකිල්ලක් දැක් වූ බවක් පෙනෙන්නට නැත. ක්‍රි.ව. 6 වැනි සියවසේ මැද භාගයට අයත්වන නිලගම ලිපියේ අකුරු වටකුරු ස්වරූපයක් ගනී. නමුත් නාගිරිකන්ද ලිපියේ අතුරු ලතාකාරය. නිලගම ලිපියෙහි 'අ' අක්ෂරය ස්වරූප තුනකින් හඳුනාගත හැකි ය. මේ සියල්ලටම වඩා වෙනස් රූප කුඩාරත්මලේ ලිපියේ ඇත. 'ආ' 'ඇ' 'ඈ' යන අකුරු අධ්‍යයනය කරන ලද ලිපි තුළින් හඳුනා ගැනීමට නොලැබුණි. 'ඉ' අඩු වශයෙන් යෙදුනත් නිලගම ලිපියෙහි එම අක්ෂරය ස්ථාන 8 කින්ම හඳුනාගත හැකි විය. මැදගම විහාරයේ වහරල ලිපියක 'උ' අක්ෂරය දකුණට විවෘත වන ලෙස ලියැවුණු කෝණයක මුදුනේ රේඛාව අගින් වමට නැඹුරුව ඇත. බරෝස්

මණ්ඩපය අසල ඇති ලිපිවල එය වඩාත් කවාකාර හැඩයක් ගනී. ඒ අක්ෂරයේ පතුලේ රේඛාව මැදින් ඇතුළට නැමී දෙපස කොන් දෙක ලතාකාර වී තිබෙන බවක් කුඩාරත්මලේ ලිපියේ හඳුනාගත හැකි විය. බරෝස් මණ්ඩපය අසල ඇති ලිපිවල 'එ' අකුර දකුණු රේඛාවෙන් මදක් වමට බරව ඉහලට විහිදුණු හා එහි අර්ධ වෘත්තය දකුණට හැර වී ඇති අතර එය ආකාර දෙකකින් හඳුනාගත හැකි ය.

'බ' අක්ෂරය සඳහා මේ අවධියෙහි දී ලැබෙන බොහෝ රූප පූර්ව කාලීන රූපවලින් වෙනස් වන්නේ ඍජු සිරස් රේඛාව මැදින් වැටුණු හරස් රේඛාව දෙපසින් පහළට වක් වීමත් සිරස් රේඛාවේ පහළ කෙලවර වමට නැඹුරුව වක් වීමත් නිසා හෙයින් උට්ටිමඩුව හා මැදගම විහාර වල ලිපිවල 'ක' අක්ෂරයේ ශීර්ෂය කුඩා වෘත්තයකින් යුක්ත වේ. බිලි කොක්කක හැඩය ගත් 'බ' අක්ෂරයක් කුඩාරත්මලේ ගිරි ලිපියෙන් ලැබේ. එහිම වෘත්තාකාර පැරණි 'ග' අක්ෂරයක් හමු වේ. රිදී විහාර ලිපියේ අශ්ව ලාඩමක හැඩය ගත් මේ අක්ෂරයේ වමපස කෙළවර පුඩුවක ආකාරයක් ගෙන ඇතුළට වක් වී ඇත. මෙයට කලින් හමු නොවූ පරිණත 'ච' රූපයක් රිදී වහාර සැරසුම්ගල ලිපියෙන් ලැබේ. මුදුනේ ඇති හරස් ඉරට සමබන්ධ වූ රේඛා දෙක වටින් වෙන්ව ගොස් වම්පස රේඛාව හැඩයක් ගන්නා වූත් දකුණු පස රේඛා මතට හරස් ඉරක් එකතු වී තිබේ. බරෝස් මණ්ඩපය අසල වෙස්සගිරිය වැනි ලිපිවල ඒ ආකාරයෙන් දැකගත හැකි වුවත් කුඩාරත්මලේ ලිපියේ තිරස් රේඛා දක්නට නැත. උට්ටිමඩුවල බරෝස් මණ්ඩපය අසල ලිපිවල අර්ධ වෘත්තාකාර රේඛාව පතුලේ උඩට නැමුණු කන්තු හැඩයක් සාදමින් ඉහලට වක් වෙයි. මැදගම විහාරයේ වහරල ලිපියේ 'ඩ' අක්ෂරයේ ශීර්ෂය වඩා විශාල කොකු හැඩයක් ගනී. වෙස්සගිරියේ 'ණ' අක්ෂරය හඳුනාගත හැකි අතර කුඩාරත්මලේ ලිපියේ එය අලංකාරව පවතී. කුඩාරත්මලේ ලිපියේ 'ත' අක්ෂරය ඒ ආකාරයෙන් පවතී. සංගමුවිහාර ලිපියේ ද අකුර අර්ධ වෘත්තාකාර රේඛාවෙහි කෙළවරට ඍජු කෙටි රේඛාවක් එක් වෙයි. මුල් රූපයෙන් වෙනස් රූප රාශියක් ද අක්ෂරයෙන් මේ කාලයේ හඳුනාගත හැකි ය. නිලගම කුඩාරත්මලේ ලිපිවල එන 'ද' අක්ෂරයේ දකුණට විවෘත වූ වක්‍රයේ පහළ කෙළවර වමට වක්‍ර වීම විශේෂ රූපයක් වුව ද එය වර්තමාන 'ද' අක්ෂරයේ ස්වරූපය ගැන කථා කිරීමේ දී පසුගාමී බවක් පෙන්වයි. 'න' අක්ෂරයේ සැලකිය යුතු වෙනසක් පෙර අවධිවලට වඩා මෙම ලිපිවල දැකගත නොහැක. කුඩාරත්මලේ ලිපියෙන් තරමක් දියුණු 'න' රූපයක් හමුවන අතර මැදගම ලිපියෙන් වර්තමාන 'න' අකුරට සමාන අකුරක් හඳුනාගත හැකි ය. කෝණාකාර රූප මෙන්ම වම්පස රේඛාවේ මුදුනට හරස් ඉරි කැබැල්ලක් යෙදුණු පතුල වටකුරු 'ප' අකුරු වහරල ලිපිවල මෙන්ම සම කාලීන අනෙකුත් ලිපිවලත් කෝණාකාර රූප මෙන්ම වම්පස රේඛාවේ මුදුනට හරස් ඉරි කැබැල්ලක් යෙදුණු පතුල වටකුරු 'ප' අකුරු වහරල ලිපිවල මෙන්ම සමකාලීන අනෙකුත් ලිපිවලත් හඳුනාගත හැකි ය. 'බ' අක්ෂරයේ ඒ තරම් වෙනසක් දක්නට නොලැබේ. 'ම' අක්ෂරයෙහි රූප කෝණාකාරව හා ලතාකාරව හඳුනාගත හැකි ය. වෘත්තාකාරව ලියැවුණු මුදුන හරස් ඉරකින් සම්බන්ධ වූ 'ම' අක්ෂරයේ රූපාන්තරය නිලගම කුඩාරත්මලේ ලිපිවලින් ලැබේ.

'ය' අර්ධ වෘත්ත දෙකක් එකට ඈදුණු මැදින් සිරස් රේඛාව හා හරස් කෙටි ඉර ඇති රූපාන්තර කුඩාරත්මලේ ලිපියෙන් ලැබේ. සමකාලීන 'ප' අක්ෂරයේ ස්වරූපය ගත් 'ය' අකුරු බරෝස් මණ්ඩපය අසල ලිපිවලින් හඳුනාගත හැකි ය. 'ර' අක්ෂරයේ සැලකිය යුතු වෙනස්කමක් මෙම ලිපිවල ඊට පෙර ලිපිවලට වඩා හඳුනාගැනීමට නැතත් නිලගම හා කුඩාරත්මලේ ලිපිවල 'ර' යනු තනි ලම්භක රේඛාවකි. උට්ටිමඩුව ලිපියේ ලම්භකය මුදුනේ කුඩා වෘත්තයක් හඳුනාගත හැකි ය. බරෝස් මණ්ඩලය අසල කුඩාරත්මලේ රිදීවිහාර සැරසුම්ගල ලිපිවල 'ල' අක්ෂරයේ වර්ධනීය අවස්ථා හඳුනාගත හැක. 'ව' අක්ෂරය වහරල ලිපිවල හමුවන විශේෂ සංකේතයක් ලෙස උට්ටිමඩුව ලිපියේ දැකගත හැක. එවැන්නක් හමුවන්නේ මෙම ලිපියෙන් හා කන්දකාඩු ලිපියෙන් පමණි. මුදුනේ පුඩුවක් ඇති 'ල' රූපයන් ඒවායේ ද හඳුනාගත හැකි ය.

'ශ' හා 'ෂ' අක්ෂර යෙදුණු කිසිදු වහරල ලිපියක් අධ්‍යයනය කරන ලද සෙල්ලිපි තුළින් හඳුනාගැනීමට නොලැබුණි. සමකාලීන අනෙකුත් සෙල්ලිපි වල දැකගත හැකි හරස් ඉර වෙනුවට ප්‍රධාන රේඛාව කවාකාරව වමට යෙදුණු කොකු හැඩය සහිත ඉතා දියුණු 'ස' අක්ෂරය රිදීවිහාර සැරසුම්ගල වහරල ලිපියෙන් හඳුනාගත හැක. වර්තමාන 'හ' අක්ෂරයට සපුරාම සමාන වූ සංකේත කිහිපයක් රිදීවහාර සැරසුම්ගල හා වෙස්සගිරියට හා මැදගම ලිපිවලින් දක්නට ලැබේ. සැරසුම්ගල ලිපියෙහි දක්නට ලැබෙන 'ළ' රූපයෙහි පහළ අර්ධ වෘත්තය කෙළවර වන්නේ තිතක් සහිතව ය. ඉතා විශාල වූ අර්ධ වෘත්තයකින් සමන්විත පහළ කොටසින් යුත් අක්ෂර ශීර්ෂ රේඛාව සහිත සංකේත දෙකක් බරෝස් මණ්ඩපය අසල ලිපිවලින් හඳුනාගත හැක. කුඩාරත්මලේ ලිපියේ 'ක්ඛ' බැඳි අකුරක් වශයෙන් පවතී.

එමෙන්ම මෙම ලිපිවල අක්ෂරයන්ගේ විවිධ ප්‍රමාණයන් හඳුනාගත හැකි ය. එක් ලිපියක් ගතහොත් එහි අකුරක දිග පළල හා එම අකුරේ ගැඹුර එම ලිපියේම අනෙක් අකුරේ ප්‍රමාණයට වඩා වෙනස්වන අවස්ථා ඇති බව හඳුනාගත හැකි විය. එකම සෙල් තලයේ ලිපි දෙකක් හෝ ඊට වැඩි ගණනක් සටහන් කර ඇති අවස්ථා ද පැවතුණි. එසේම ආරම්භයේ පටන්ම තුන්වන ශතවර්ෂය තෙක්ම ලියැවුණු ලිපි බොහෝමයක්ම ප්‍රාකෘත ලක්ෂණ බොහෝ සෙයින් දක්නට ඇතත් අනුක්‍රමයෙන් ඒවා ලිහිල්ව යන ආකාරය පසුව දක්නට ලැබේ. වර්තමාන සිංහලයට ආවේණික වූ බොහෝ ලක්ෂණ වහරල ලිපි අයත් කාල වකවානුව තුළ දක්නට ඇති නිසා සිංහල භාෂා ඉතිහාසය සම්බන්ධ වැදගත් යුගයක් ලෙස නම් කළ හැකි ය. ප්‍රාකෘත යුගයේ දී දීර්ඝ ස්වර කෙටි වීම මෙන්ම සංයුක්තාක්ෂර තනි වීමක් ද දක්නට ලැබුණි. එහෙත් මෙය ලිවීමේ සම්ප්‍රදායට පමණක් සීමා වූ ලක්ෂණයක් බව සිතන්නට පිළිවන. මේ ලක්ෂණය උච්චාරණයටද ඇතුළුව නියම භාෂා ලක්ෂණ ලෙස සකස් වූයේ මේ යුගයේ දී යැයි කිව හැකි ය. සංස්කෘත මූල භාෂාවන්ගෙන් භින්න වූ වචන කිහිපයක් හඳුනාගත හැකි ය. විශේෂයෙන් මද වශයෙන් හෝ එකී අර්ථයෙන් යොදන ලද ඊට සමගාමී වචනත් වහරල හා එහි විවිධ රූපත් හඳුන්වා දිය හැකි ය. ශබ්ද තද්භව වීමෙ දී අඝෝෂාක්ෂර ඝෝෂාක්ෂර බවට පත්වන ආකාරයක් ද දැකගත හැකි විය. උදාහරණ ලෙස කහාපණ > කහවණ, පාචීන > පජින, සංවච්ඡර > හවජර, අභය > අපය, පධානඝර > පතනගල, පයන්නට 'ච' කාරය ද බොහෝ විට යොදා ගෙන ඇති බව පෙනේ.

මෙරට සෙල්ලිපි රචනය සැලකුවහොත් මුල්කාලීන සෙල්ලිපි බොහෝමයක බලාපොරොත්තුව වී ඇත්තේ තමන් කරන ලද දෙයක්, තමන් සංඝයාට පූජා කරන ලද දෙයක් හෝ ලෝ ජනයාගේ දැන ගැනීම පිණිස සටහන් කර තැබීම යි. එහි දී ව්‍යාකරණමය හෝ භාෂාමය නිවැරදි භාවය පිළිබඳ ඔවුන්ගේ අවධානයට යොමුව නැතැයි සිතිය හැකි ය. නමුත් තමන් කරන ලද දෙය සෙසු ජනයාට වටහා ගත හැකි ආකාරයෙන් සටහන් කිරීමක් මෙම මුල්කාලීන ලිපිවල හඳුනාගත හැකි ය. වහරල ලිපි රචනා වී ඇත්තේ මීට සියවස් හය හතකට පසුව නිසා මෙම ලිපිවල ව්‍යාකරණයන් පිළිබඳ මොවුන් සැලකිලිමත් වන්නට නැතැයි සිතිය හැකි ය. ප්‍රධාන වශයෙන් චිදවි යන්න ආඛ්‍යාතයක් වශයෙන් ද වෙයවය යන්න උත්තම පුරුෂයේ යෙදෙන වෙමි යන්නට සමාන යෙදීමක් වශයෙන් ද යොදාගෙන ඇති ආකාරය දැකිය හැකි ය. ඒ අනුව චිදවි යන්න චදවල, චදෙවල, සිදව ආදී වශයෙන් ද යෙදී තිබෙනු හඳුනා ගත හැකි ය. ඒ අනුව සමස්ථයක් වශයෙන් මෙකී වහරල ලිපිවල භාෂා ස්වරූපය විමසන කළ භාෂාව වෙනස්වෙමින් පැවති බවත්, වචන වල රූපයන් බෙහෙවින් අවිනිශ්චිත තත්ත්වයක් පවතින්නට ඇති බවත් පෙනේ. එසේම මෙම ලිපි හී බොහෝ විට සවසටනට යන්න යෙදී ඇති අතර එය ප්‍රාර්ථනාවක් සිදු කරන ලද අවස්ථාවක් වශයෙන් හඳුනාගත හැකි ය. එසේම බොහොමයක් වහරල ලිපිවල පද බෙදීමක් හඳුනාගත හැකි අතර මෙම වහරල ලිපි හී පද යෙදීමකින් ද කර ඇති ආකාරය හඳුනාගත හැකි ය.

වහරල ලිපි බොහෝ විට ලිය වී ඇත්තේ විහාරාරාම ආශ්‍රිත ගල්තලා හෝ සඳකඩපහන් ටැම් ආශ්‍රය කරගෙන ය. එම නිසා මෙම ලිපි ලෙන් ලිපිවල මෙන් ඉඩකඩ මදිවීම් යනාදියට ලක්ව නොමැති අතර පෙළ වශයෙන් ලියවී ඇත. එම නිසා ව්‍යාකරණ ගැටළු මෙහි දක්නට ලැබෙනුයේ මෙම කාලයට සාපේක්ෂව සැලකීමේ දී ඉතා අල්ප වශයෙනි. නමුත් මෙම ලිපි බෙහොමයක ලිපිය අවසන් නොකිරීම යනාදී ලක්ෂණයන් දැකගත හැකි ය. එසේම අන්තර්ගතය සැලකීමේදී ද ඓතිහාසික කරුණු අන්තර්ගතය ඉතා සීමිතය. එමෙන්ම අතීත කාල කෘදන්ත රූපයක් අවසාන ක්‍රියාවක් ලෙස යෙදී තිබෙන ආකාරය මෙම වහරල ලිපි වලින් අනාවරණය වේ. පුරාන සිංහල යුගයේ අපර භාගයට අයත් යැයි සැලකිය හැකි ලිපියක 'සඳව' යනුවෙන් දැකිය හැකි ය. මේ සම්බන්ධයෙන් අපගේ මතය වන්නේ වහරල යනු විහාරය ආශ්‍රිත වූ අනිවාර්ය සේවයක් ලෙස සවන හා සත්වන වර්ෂයන් හී ජනයා අතර ප්‍රචලිත වූ පූජා ක්‍රමයක් බව ය. තව ද 'ගිරිවෙල වද පුත දස පහ චිදවි' මෙහි දස යන්න සංස්කෘතියේ එන යන්නට සමාන වන නිසා එමගින් දාස යන්නත් පහ යන්න පාශ යන්නත් ලෙසත් ගෙන පරණවිතානයන් මේ අනුව මෙම ලිපියෙන් කියවෙනුයේ දාස බාවයෙන් මිදවීමක් බව පෙන්නා දේ. එහි අන්තර්ගතය සලකමින් චිදවී යන්නට තේරුම ලබා දෙන එතුමා වහරල යනු ද එසේ වූ දාස බාවයක් යැයි සඳහන් කරයි.

## නිගමනය

ශ්‍රී ලංකාවේ "වහරල ලිපි" වල අක්ෂර භාවිතය වර්තමානයේ පවතින වාග්විද්‍යාත්මක න්‍යායන් ඔස්සේ අර්ථනිරූපනය කළ හැකි විය. ඒ අනුව වහල ලිපි යන්නට තවමත් නිශ්චිත අර්ථකථනයක් නොමැත. කෙසේ නමුත් මෙම අධයයනය හරහා වහරල ලිපි වල අක්ෂර භාවිතය පිළිබඳ මනා අවබෝධයක් ලද හැකි විය. අධයයනය අවසානයේ මා හට සොයා ගත හැකි වූයේ වහරල ලිපි යනු ක්‍රි.ව. 5, 6 හා 7 යන සියවස් වල සිංහල භාෂාවෙහි එනම් වර්තමාන සිංහලයට ආවේණික වූ බොහෝ ලක්ෂණ වහරල ලිපි අයත් මෙම කාල වකවානුව තුළ දක්නට ඇති නිසා සිංහල භාෂා ඉතිහාසය සමබන්ධ වැදගත් කාල වකවානුවක් ලෙස නම් ක්‍රි.ව. 5,6 හා 7 සියවස් සඳහන් කළ හැකි බව ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. අමරවංශ හිමි, ලක්දිව සෙල්ලිපි, කොත්මලේ: ඇම්.ඩි. ගුණසේන සමාගම, 1969.
2. ගුණසේකර, බන්දුසේන, සිංහල අක්ෂර සම්භවය හා එහි විකාශනය, කොළඹ 10 : එස් ගොඩගේ සහ සහෝදරයෝ, 1996.
3. ඩයස් මාලනි, ලක්දිව සෙල්ලිපි වලින් හෙළිවන සිංහල භාෂාවේ ප්‍රත්‍යාර්ථ නාමයන්ගේ විකාශනය ක්‍රි.පූ. 3- ක්‍රි.පූ.10 දක්වා
4. ප්‍රියංකර, බෙනිල්, ලක්දිව පැරණි සෙල්ලිපි වල බහුලව හමුවන මෙතෙක් නොවිසඳුන වදන් දෙකක් වහරල හා මෙතෙර මජිබක, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2012.
5. මුදියන්සේ නන්දසේන, ශිලාලිපි සංග්‍රහය III වෙළුම , පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සිංහල ශිලා ලේඛන සංග්‍රහය, කොළඹ 10 : එස් ගොඩගේ සහ සහෝදරයෝ, 2000.
6. විමල කිත්ති හිමි, මැදඋයන්ගොඩ, ශිලා ලේඛන සංග්‍රහය, කොළඹ 10 : එස් ගොඩගේ සහ සහෝදරයෝ, 2004.

7. Paranavithana. S, Epigraphia Zeylanica Volume 2, Publish for the Government of Ceylon by Humphrey Milford Oxford University.
8. Zilva Wickramasingha, Epigraphia Zeylanica Volume 3, Humphrey Milford Oxford University, 1993.
9. Paranavithana. S" Inscription of Ceylon Volume 1, Archaeological Servey Department of Sri Lanka, 1970.